මගේ අංකය - !0028/MDTU/LT/PG/2024/01/01
කළමණාකරණ සංවර්ධන හා පුහුණු අංශය,
2024.07. 09

සියළු නිළධාරීන් වෙත,

**<u>කාර්යක්ෂමතා කඩයිමක් ලෙස පශ්චාත් උපාධිය හැදෑරීම අවශ්‍ය වන නිලධාරීන් සඳහා ප්‍රතිපාදන</u>**

දෙපාර්තමේන්තුවෙහි කාර්ය මණ්ඩලය අතරින් සිය කාර්යක්ෂමතා කඩයිම් අවශ්‍යතාවක් ලෙස පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරිය යුතු නිළධාරීන් හට එම පාඨමාලා ගාස්තු හෝ ඉන් කොටසක් පවතින ප්‍රතිපාදන තත්වය මත දෙපාර්තමේන්තුව මඟින් ගෙවීමට හැකියාව ඇත. ඒ සම්බන්ධයෙන් මුදල් ගෙවීමේ පදනම සහ අදාල කොන්දේසි ක්ෂේත්‍ර මණ්ඩල චක්‍රලේක අංක 11/2023 සහ 2023-12-13 දිනැති චක්‍රලේකය මඟින් විස්තර කර ඇති අතර (ඇමුණුම 1) , ඒ සඳහා අයදුම් කිරීමට බලාපොරොත්තු වන්නේ නම්, 2024.08.16 දිනට පෙර අදාල ලේඛන පිටපත් ද සමඟ අතිරේක සර්වේයර් ජනරාල් (මධ්‍යම) වෙත එවීමට කටයුතු කරන ලෙස දන්වමි. (ඊමේල් - snrssmdtu@survey.gov.lk)

02. මෙය 2024 වර්ෂයේ ආරම්භ කරන ලද සහ ආරම්භ කිරීමට නියමිත පාඨමාලා සඳහා පමණක් අදාල වේ.

03. පාඨමාලා හදාරන සියළු නිලධාරීන් නියමිත කාල සීමාව තුල පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු අදාල විශ්ව විද්‍යාලය මඟින් නිකුත් කරනු ලබන සහතිකයේ සත්‍ය පිටපතක් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී (කළමණාකරණ සංවර්ධන හා පුහුණු) වෙත යොමු කිරීමට කටයුතු කල යුතුය.

04. එසේම පාඨමාලාව සම්පූර්ණ කිරීමට අපොහොසත් වුවහොත්, දෙපාර්තමේන්තු ප්‍රතිපාදන වලින් ගෙවන ලද පාඨමාලා ගාස්තුව අදාල නිලධාරියාගේ වැටුපෙන් අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

ඩබ්ලිව්.සුදත් එල්.සී. පෙරේරා
සර්වේයර් ජනරාල්
සර්වේයර් ජනරාල් කාර්යාලය
කොළඹ 05.

ඩබ්ලිව්.සුදත්.එල්.සී.පෙරේරා
සර්වේයර් ජනරාල්

ක්ෂේත්‍ර මණ්ඩල චක්‍රලේඛ අංක: 11/2023

මගේ අංකය - 10028/MDTU/Training/Training Policy /2023/02
කළමනාකරණ සංවර්ධන හා පුහුණු,
සර්වේයර් ජනරාල් කාර්යාලය,
කොළඹ 05.
2023.12. 13

සියළුම අතිරේක සර්වේයවර් ජනරාල්වරුන්,
සියළුම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්,
අධ්‍යක්ෂ (මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය),
සියළුම නියෝජ්‍ය / පළාත් සර්වේයර් ජනරාල්වරුන්,
අධ්‍යක්ෂ (මුදල්),
සියළුම ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිවරුන්,
සියළුම මිනින්දෝරු අධිකාරිවරුන් වෙත.

<u>දේශීය පාඨමාලා සඳහා ගාස්තු ගෙවීම.</u>

සර්වේයර් ජනරාල් කාර්යාලයේ සහ ක්ෂේත්‍ර කාර්යාල වල සේවය කරනු ලබන නිලධාරීන් විසින් හදාරනු ලබන පාඨමාලාවන් සඳහා ගාස්තු ගෙවීම මින් ඉදිරියට පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

02. ඒ අනුව SG/MDTU/2021/EB / MTO හා 2021.05.03 දිනැති ලිපිය, 10028/MDTU/LT/PG/01/01 සහ 2022.05.25 දිනැති ලිපිය, SG/Admin/CS/8/භාෂා ප්‍රතිපත්තිය සහ 2022.10.26 දිනැති ලිපිය සහ 10028/MDTU/Training/LT/2023/01 හා 2023.02.14 දිනැති සියලු ලිපි වලට වැඩිමනත් වශයෙන් පහත කරුණු වලට අදාලව පාඨමාලා සඳහා ගාස්තු ගෙවීම 2023.12.01 දින සිට ඉදිරියට ක්‍රියාත්මක වන පරිදි සිදු කෙරේ.

**01. මිනින්දෝරු සේවයේ III/II වන කාර්යක්ෂමතා කඩයිම.**
මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය විසින් සංවිධානය කරනු ලබන පාඨමාලාවන්ට අමතරව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට මුදල් ගෙවා පාඨමාලාවන් හැදෑරීමට අවස්ථාව ඇති බැවින් එවැනි අවස්ථාවකදී පාඨමාලාව හැදෑරීමට පෙර සහ වියදම් දැරීමට පෙර අතිරේක සර්වේයර් ජනරාල්(මධ්‍යම) ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය. අනුමැතියෙන් පසු අදාල සහතිකපත්, ගෙවීම් වවුචර් පත් සහ ගෙවීම් ඉන්වොයිසියන් ඉදිරිපත් කිරීමෙන් පසු පවතින ප්‍රතිපාදන තත්වය මත සර්වේයර් ජනරාල් විසින් අනුමැතිය ලබාදී ඇති මුදල හෝ ඉන් කොටසක් ප්‍රතිපූර්ණය කල හැක. තවද අනිවාර්ය සේවා කාලය සර්වේයර් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබේ.

**02. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩයිම.**
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන ත්‍රෛමාසික පාඨමාලාවක් ලෙස මෙය පැවැත්වෙන අතර, පාඨමාලාව හැදෑරීමට පෙර සහ වියදම් දැරීමට පෙර අතිරේක සර්වේයර් ජනරාල් (මධ්‍යම) ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය. අනුමැතියෙන් පසු අදාල සහතිකපත්, ගෙවීම් වවුචර් පත් සහ ගෙවීම් ඉන්වොයිසියන් ඉදිරිපත් කිරීමෙන් පසු පවතින ප්‍රතිපාදන තත්වය මත සර්වේයර් ජනරාල් විසින් අනුමැතිය ලබාදී ඇති මුදල හෝ ඉන් කොටසක් ප්‍රතිපූර්ණය කල හැක. තවද අනිවාර්ය සේවා කාලය සර්වේයර් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබේ.

**03. කාර්යක්ෂමතා කඩයිමක් ලෙස හැදෑරිය යුතු පශ්චාත් උපාධිය - ඒකාබද්ධ සේවා නිලධාරීන් / දෙපාර්තමේන්තු නිලධාරීන්**

දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය අතරින් සිය කාර්යක්ෂමතා කඩයිම අවශ්‍යතාවයක් ලෙස පශ්චාත් උපාධිය හැදෑරීමට බලාපොරොත්තු වන නිලධාරීන් අදාල ලේඛන පිටපත් ද සමඟ අතිරේක සර්වේයර් ජනරාල් (මධ්‍යම) වෙත එවීමට කටයුතු කළයුතු වේ. පාඨමාලා ගාස්තු වාරික වශයෙන් ගෙවීමේ හැකියාව ඇත්නම් එම තොරතුරුද ඒ සමඟ ඉදිරිපත් කළයුතුය.

පවතින ප්‍රතිපාදන ප්‍රමාණය හා දැනට පවතින කාර්ය මණ්ඩලය සමානුපාතිකව බලා පාඨමාලා ගාස්තු ගෙවනු ලබන නිලධාරීන් සංඛ්‍යාව අතිරේක සර්වේයර් ජනරාල් (මධ්‍යම) විසින් තීරණය කරනු ඇත. තවද අනිවාර්ය සේවා කාලය සර්වේයර් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබේ.

**03.1. ඒකාබද්ධ සේවාවන්හි නිලධාරීන්:**

මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ දිනය හා දෙපාර්තමේන්තුවෙහි සේවා කාලය පිලිබඳ විස්තර සැපයිය යුතු අතර, එම උපාධිය හැදෑරීමෙන් පසු වසර 03ක අනිවාර්ය සේවා කාලයක් සේවය කළයුතු වේ.

**03.2. දෙපාර්තමේන්තු නිලධාරීන්:**

පුහුණුවෙන් පසු සර්වේයර් ජනරාල් නියමකරන පරිදි මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ හෝ ප්‍රධාන කාර්යාලයේ අවම වශයෙන් වසර 03ක් සේවය කල යුතුය
.

**04. රා.ප. චක්‍රලේඛ 18/2020 රාජ්‍ය භාෂා පාඨමාලාව (සිංහල/දෙමළ)**

කණ්ඩායම් පුහුණු ප්‍රමාණවත් නොවන අවස්ථා වලදී පෞද්ගලිකව පාඨමාලාව හැදෑරීමට අවස්ථාව ඇති බැවින් එවැනි අවස්ථාවකදී පාඨමාලාව හැදෑරීමට පෙර සහ වියදම් දැරීමට පෙර අතිරේක සර්වේයර් ජනරාල් (මධ්‍යම) ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය. අනුමැතියෙන් පසු අදාල සහතිකපත් සහ ගෙවීම් වවුචර් පත් සහ ගෙවීම් ඉන්වොයිසියන් ඉදිරිපත් කිරීමෙන් පසු පවතින ප්‍රතිපාදන තත්වය මත සර්වේයර් ජනරාල් විසින් අනුමැතිය ලබාදී ඇති මුදල හෝ ඉන් කොටසක් ප්‍රතිපූර්ණය කල හැක.

**05. දේශීය පුහුණු පාඨමාලා - (කෙටිකාලීන)**

අත්‍යාවශ්‍ය පාඨමාලා සඳහා තෝරාගන්නා නිලධාරීන් සඳහා මෙම පාඨමාලා හැදෑරීමට අවස්ථාව ඇත.වසර දෙකක් ඇතුලත තම ක්ෂේත්‍රයට අදාළ පාඨමාලාවක් හදාරා නොමැති, නිලධාරීන් හට ප්‍රමුඛතාවය ලබදෙයි. පාඨමාලාව හැදෑරීමට පෙර අතිරේක සර්වේයර් ජනරාල් (මධ්‍යම) ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය. අනුමැතියෙන් පසු අදාල ගෙවීම් ඉන්වොයිසියන් ඉදිරිපත් කිරීමෙන් පසු ප්‍රතිපාදන ලබාදීම සිදුකෙරේ.

**06. විදේශීය පුහුණු පාඨමාලා (කෙටිකාලීන/ දිගුකාලීන)**

පුහුණුව සඳහා නිලධාරීන් තෝරා ගැනීමෙන් අනතුරුව ගාස්තු ගෙවීම සම්බන්ධව සහ අනිවාර්ය සේවා කාලය පිළිබඳව සර්වේයර් ජනරාල් විසින් තීරණ කරනු ලබයි. මිනින්දෝරු සේවයේ නිලධාරීන් පුහුණුවෙන් පසු සර්වේයර් ජනරාල් නියමකරන පරිදි මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය සහ ප්‍රධාන කාර්යාලයේ අවම වශයෙන් වසර 03ක් සේවය කල යුතුය.

**07. මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය මත සර්වේයර් ජනරාල් විසින් තෝරා ගන්නා ලද පාඨමාලා**

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය මත සර්වේයර් ජනරාල් විසින් තෝරා ගන්නා ලද පාඨමාලා සඳහා කොන්දේසි ඒ ඒ අවස්ථාවේදී සර්වේයර් ජනරාල් විසින් තීරණය කරනු ලැබේ. තවද අනිවාර්ය සේවා කාලය සර්වේයර් ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබේ.

**ඉහත පාඨමාලා සඳහා මුදල් ගෙවීමේ පදනම.**

I.පාඨමාලා ගාස්තුව රු.20,000.00ක් හෝ ඊට වඩා අඩු මුදලක් නම් සම්පූර්ණ ගාස්තුවද

II.පාඨමාලා ගාස්තුව රු.20,000.00ට වැඩිනම් 100,000.00ට වඩා අඩුනම් පාඨමාලා ගාස්තුවෙන් 75%ක් හෝ අවම වශයෙන් රු.20,000.00ක මුදලක්ද

III.පාඨමාලා ගාස්තුව රු100,000.00 හෝ ඊට වඩා වැඩි නම් පාඨමාලා ගාස්තුවෙන් 50%ක් හෝ රු.75,000.00ක මුදලක් හෝ පවතින ප්‍රතිපාදන තත්වය මත සර්වේයර් ජනරාල් විසින් නියම කරනු ලබන මුදලක්ද

IV.සර්වේයර් ජනරාල් විසින් තෝරාගන්නා ලද පාඨමාලා සඳහා සම්පූර්ණ ගාස්තුවද

වශයෙන් ඉහත සියලුම පාඨමාලා නියමිත කාලසීමා තුළදී සම්පූර්ණ කිරීම කළයුතු අතර, එසේ කිරීමට අපොහොසත් වුවහොත් දෙපාර්තමේන්තු ප්‍රතිපාදන වලින් ගෙවන ලද පාඨමාලා ගාස්තුව අදාල නිලධාරියාගේ වැටුපෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

උක්ත පාඨමාලාවන් හැදෑරීමෙන් පසුව ලබාගන්නා දැනුම දෙපාර්තමේන්තු අවශ්‍යතා සඳහා යොදාගන්නා අවස්ථා වලදී ඒ සඳහා අවශ්‍ය සහය ලබාදිය යුතුය. තවද එම පාඨමාලාවෙන් ලබාගන්නා ලද දැනුම දෙපාර්තමේන්තුවේ අනෙකුත් නිලධාරීන් වෙත ලබාදීම ට හෝ සම්මුඛ පරීක්ෂණයකට මුහුණ දීමට හෝ කෙටි ප්‍රශ්නාවලියකට පිළිතුරු සැපයීම වැනි අවස්ථාවන් සඳහා සර්වේයර් ජනරාල් විසින් නියම කරන ලද අවස්ථාවකදී සිදුකළ යුතුය.

ඩබ්.සුදත්.එල්.සී.පෙරේරා
සර්වේයර් ජනරාල්

ඩබ්ලිව්.සුදත් එල්.සී. පෙරේරා
සර්වේයර් ජනරාල්
සර්වේයර් ජනරාල් කාර්යාලය
කොළඹ 05.